**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 492**
**ආයතනයේ නම : ජනමාධ්‍ය අමාත්‍යාංශය**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද
වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ
ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

**பாராளுமன்ற வெளியீட்டிலக்கம் - 492**
**நிறுவனத்தின் பெயர் : வெகுசன ஊடக அமைச்சு**
பாராளுமன்ற அரசாங்க கணக்குக் குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கை தொடர்பில்
நிலையியற் கட்டளை இலக்கம் 119 (4) கீழ்
கௌரவ அமைச்சரின் அவதானிப்பு மற்றும் எடுக்கப்பட்ட
நடவடிக்கைகள் பாராளுமன்றத்திற்கு முன்வைத்தல்.

**Parliamentary Series No.492**
**Name of the Institution : Ministry of Mass Media**

Submission of observations of the Hon. Minister and steps taken with regard to the reports tabled by The Committee on Public Account in terms of Standing Ordrer No 119(4)

ආකෘතිය ( අංක 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492

ජනමාධ්‍ය අමාත්‍යාංශය

| පළමු කොටස : 82.00 | | |
|---|---|---|
| අනු අංක | කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු | අඩුපාඩු තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග |
| 1. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | අංක 2/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම - 2023 ප්‍රධාන ගණන් දීමේ නිලධාරී අනුමැතිය නියමිත දිනට පෙර ලබා ගැනීමට නොහැකි වුවත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගෙන 2023 ජනවාරි 18 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.<br>කෙසේ වෙතත් මේ වන විට අදාළ කාල රාමුව තුළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුමත කර ගැනීම සඳහා කටයුතු කර ඇත. |
| 2. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | 2026 වර්ෂයට අදාල වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත. |
| 3. | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | විගණන විමසුම් සඳහා අමාත්‍යාංශයේ විවිධ අංශ වෙතින් පිළිතුරු කැඳවා අවසන් පිළිතුර සකස් කිරීමේදී යම් ප්‍රමාදයන් ඇතිවේ. එවැනි අවස්ථාවල අතුරු පිළිතුරුක් හෝ යොමු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| 4. | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | `අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම නියමිත කාල සීමාව තුළ සිදු කරනු ලැබේ. |
| 5. | 2017.06.26.දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරුතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොමැති වුවද මේ වන විට අදාල වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |
| 6. | 2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත කාල රාමුව තුළ භාණ්ඩ සමීක්ෂණය සිදු කර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙස නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. |
| 7. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | නියමිත කාල රාමුව තුළ භාණ්ඩ සමීක්ෂණය සිදු කර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙස නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. |

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

| | | |
|---|---|---|
| 8. | රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබිණි. | රජයේ වාහන අනතුරු සිදුවීමකදී මු.රෙ. ප්‍රකාරව කටයුතු කිරීම සඳහා ගතහැකි උපරිම ක්‍රියා මාර්ග සිදු කරන අතර නොවැලැක්විය හැකි හේතූන් මත අතපසුවීම් සිදුවීම්ද වළක්වා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| 9. | මු.රෙ. 94(1)ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි. | බැරකම්වලට එළඹීමේදී වර්ෂයේ ඉතිරි ප්‍රතිපාදන පිළිබඳව අවධානය යොමු කර කටයුතු කරන ලෙසට නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. |
| 10. | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | තත්කාර්ය අතුරු අග්‍රිම, කාර්යය නිම කර මසක් ඇතුළත පියවීමට මේ වන විට කටයුතු කරනු ලැබේ. |

**දෙවැනි කොටස : 91.00**

| අනු අංක | කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු | අඩුපාඩු තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග |
|---|---|---|
| 1. | සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | 2023 කාර්ය සාධන ගිවිසුම සකස් කිරීමේ කටයුතු අවසන් කිරීම ප්‍රමාද වී ඇත. මේ වන විට අත්සන් කර ඇත. |
| 2. | සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | මාර්ගගත ක්‍රමය ඔස්සේ හැකි පුහුණුවීම්වලට නිලධාරීන් සහභාගීවීමට මැලිකමක් දැක්වීම හා බාහිර ආයතනවල පුහුණු වැඩමුළු සඳහා නිලධාරීන් නම් කළ ද එම පුහුණු වැඩමුළුව එම ආයතන සැලසුම් කළ පරිදි නොපැවැත්වීම යනාදී කරුණු හේතුවෙන් පුහුණු ඉලක්කයන්ට ලඟා වීමට නොහැකි වී ඇත. |
| 3. | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය. | 2023 වර්ෂය සඳහා ලබාදී ඇත්තේ තත්වාගණනය කළ මතයකි. විගණනයේදී පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ඉදිරියේදී සත්‍ය හා සාධාරණ මතයක් ලබා ගැනීමට කටයුතු කෙරේ. |

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.